

# ගිරවා ලේනාට කළ උදව්ව

උපන්‍යා ඉන්ජල් ගුණසේකර

# ගිරවා ලේනාට කළ උදව්ව

උපන්‍යා ඉන්ජල් ගුණසේකර

කෘතියේ නම : ගිරවා ලේනාට කළ උදව්ව

ISBN : 978-624-208-194-6

කතෘ : උපන්යා ඉන්ජල් ගුණසේකර

පළමු මුද්‍රණය : 2025 පෙබරවාරි මස 8 වන දින

චිත්‍ර නිර්මාණය : උපන්යා ඉන්ජල් ගුණසේකර

කතෘගේ වෙනත් කෘති : පුංචි සමනලයා
ටිකිරි සහ බූලා

මුද්‍රණය : නෙත්වින් ප්‍රින්ටර්ස්
ගැටඹේ
081-2386908

# පිදුම

මහාමායා විදුපියසේ සිප්සතර හැදෑරීමට

පැමිණි දා පටන්

මාගේ අනාගතය අලෝකමත් කිරීමට

මාගේ ගුණ නුවණ වඩා වර්ධනය කිරීමට

සෑම අතින්ම කැප වී ක්‍රියා කළ

අප විද්‍යාලීය විදුහල්පතිතුමිය ඇතුව

සියළු ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට

මේ කෘතිය

ආදර ගෞරවයෙන් යුතුව පුදමි.

උපන්යා ඉන්ජල් ගුණසේකර

# පෙරවදන

සාහිත්‍යය දියුණු රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය එට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකොමත් එක කාලයක එක අඹ ගහක ලේනෙක් අඹ කන්න ඇවිත් සිටියා. ඒ ලේනා අඹ කමින් සිටින විට දී ගිරවෙක් අඹ ගහට පැමිණියා. ඒ විටදී ගිරවාත් අඹ කන්න පටන් ගත්තා.



දැන් ලේනාට හොඳටම බඩ පිරිලා. ඉතින් ලේනා දැන් ගහෙන් ගහට පැන පැන යන විටදී ලේනා බිමට වැටී ලේනාගේ කකුල තුවාල වුණා. අනේ අසරණ ලේනාට දැන් ඇවිද ගන්න බෑ. ගිරවා මේ සිද්ධිය දැක්කා.



"අනේ, ඒ ලේනා පවු මම එයාට උදවු කරන්න ඕනේ," ගිරවා අඹ කන එක නතර කරලා ලේනාට උදවු කරන්න ගහෙන් බිමට බැස්සා. "අනේ, ලේන් යාළුවේ ඔයාට මොකද වුණේ?"



"අනේ, ගිරා යාළුවේ මගේ කකුල තුවාල වී මට දැන් ඇවිදින්න අපහසුයි."



"ඔහොම ඉන්න ලේන් යාළුවේ මම ඔයාට පලතුරු ටිකක් ගෙනත් දෙන්නම්."

"ස්තූතියි ගිරා යාළුවේ."



ඉතින් ගිරවා කැලෑවට ගොස් ලේනාට පලතුරු ටිකක් ගෙනත් දුන්නා. "ලේනෝ ඔයා අපේ ගෙදරට එන්න මම ඔයාට ප්‍රතිකාර කරන්නම්. හොඳයි, අපි දෙදෙනා දැන් යමු."

දැන් ගිරවා සහ ලේනා පිටත් වුණා. ගිරවා ලේනාගේ කකුලට බෙහෙත් දමා ප්‍රතිකාර කරා.

"ස්තූතියි යාළුවේ," ලේනා කිව්වා. "ඔබ හොඳ යාළුවෙක්, මම ඔයාට පලතුරු ටිකක් ගේන්නම්. ඔයා මට උදවු කළානේ, මමත් ඔයාට උදව් කරන්නම්, ඉන්නකෝ," ලේනා කැලේට ගොස් පලතුරු ටිකක් ගෙනවිත් ගිරවාට දුන්නා.

"ස්තූතියි යාළුවේ," ගිරවා කිවුවා. ඉතින් ඒයාලා දෙන්නා හොඳම යාළුවෝ වී කල් ගත කළා.

ඉතින් ඒගොල්ලො අනිත් සතුන්ටත් උදව් කරමින් තව යාළුවෝ ඇති කර ගත්තා.



දැන් ඒගොල්ලොන්ට යාළුවෝ ගොඩක් ඉන්නවා. ඉතින් ඒගොල්ලො සතුටින් ජීවත් වුණා.



ඉතින් ඔයගොල්ලොත් යාළුවන්ට උදව් කරන්න ඕනේ. එතකොට ඕයාලටත් ගොඩක් යාළුවෝ ඇතිවෙයි.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්